{සියලු ම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved }

# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
## மாகாணக் கல்வித்திணைக்களம்- வடமத்திய மாகாணம்
## Department of Education – North Central Province

| | | |
|---|---|---|
| ශ්‍රේණිය 11 | 2026 - අ.පො.ස.(සා/පෙළ) පෙරහුරු පරීක්ෂණය - 01<br>විෂය :- නාට්‍ය හා රංග කලාව | කාලය : පැය - 03 යි |

ශිෂ්‍යයාගේ නම /ඇතුළත්වීමේ අංකය :- ....................................................................................

පාසලේ නම :- ....................................................................................

✳ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.**

✳ **පහත පද්‍ය පන්තිය ආශ්‍රයෙන් 1 සිට 5 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A දේසේ සිට ආ එගුරු මහල්ලා
දියට යන්ට ලබු ගෙඩියක් එල්ලා
තඹරාවිට වෙද රාළගෙ බල්ලා
කාපිදු ගුරුවගෙ කකුලම අල්ලා

B සන්දර වත නුඹ
සුන්දර තඹර මල
පිංබර වේය කඳු
පැයු සේ මෙපුර

C යුනිවර්සිටි එකයි ඇත්තේ
මෙඩිකල් ෆැකල්ටි එකයි ඇත්තේ
අපි ඔක්කොම හැටක් ඇත්තේ
ෆැකල්ටියට පහයි ගත්තේ

D දන්න වංහුං අප කන්නසාමි රාජ දූරයේ
රාජ දූර රාජ දූර රාජ දූරයේ.....

E ඉඳින් බබෝ ඉඳින් - මගේ අතේ ඉඳින්
බො ආදරෙන් නුඹේ මව්මෙන් - රකින්නෙමි මෙමං

F ගම්භිර මහ නිරිඳු සමග උතුමන් වැඩමවන බැවින්
සුන්දර උඩු වියන් දමල වටතිර පාවාඩ එළන

Past Papers Wiki

01. නූතන නාට්‍ය ගීතයක් සහිත පද්‍ය කොටස් වන්නේ,

1. A හා B 2. B හා C 3. C හා D 4. D හා E

02. ප්‍රධාන කාන්තා චරිත නාමය ජන නාටකයේ නම ලෙස යොදාගත් ලාංකේය ජන නාටකයට අයත් පද්‍යයක් වන්නේ,

1. A 2. D 3. E 4. F

03. නූර්ති ගීතයක් අඩංගු අක්ෂරය වන්නේ,

1. B 2. E 3. D 4. F

04. E අක්ෂරයෙන් දැක්වෙන පද්‍යය,

1. නූර්ති ගීයකි
2. නව නාට්‍ය ගීයකි
3. කෝළම් ගීයකි
4. නාඩගම් ගීයකි

05. පහට රට ප්‍රදේශයේ වෙස් මුහුණු පැළඳ රඟ දක්වන ජන නාට්‍ය නියෝජනය කරන පද්‍ය කාණ්ඩය වන්නේ,

1. A 2. D 3. E 4. F

✲ **ප්‍රශ්න අංක 06 - 14 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිලිතුර තෝරන්න.**

06. නාට්‍යයක ලක්ෂණයක් වන්නේ,

1. අසා රසවිඳීමේ හැකියාව
2. යටි පෙලක් තිබීම
3. සිද්ධි මාලාව අනුපිළිවෙළ
4. තනිව රස විඳිය හැකි බව

07. දෘෂ්‍ය කලා මාධ්‍යයන් පමණක් අඩංගු ගොනුව වන්නේ,

1. චිත්‍ර, මූර්ති, කැටයම්
2. මූර්ති, ඔපෙරා, කාටූන්
3. කැටයම්, චිත්‍ර, චිත්‍රපට
4. ඡායාරූප, මුද්‍රා නාට්‍ය, කාටූන්

08. නෘත්තාංග ද්විත්වයක් සඳහා උදාහරණ වන්නේ

1. භරත නාට්‍යම්, තෙල්මේ නැටුම්
2. ලී කෙලි, පා සරඹ
3. කලගෙඩි නැටුම්, ශිව පාර්වතී නැටුම
4. ගොඩසරඹ, වඩිග පටුන

09. නිශ්චිත ගණිතමය රටාවකට අනුව බෙදා වෙන් කළ ක්‍රමයකට කරනු ලබන චලනයන් හඳුන්වන්නේ

1. රිද්මයානුකූල චලන ලෙසයි
2. තාලානුකූල ලෙසයි
3. ස්වභාවික චලන ලෙසයි
4. නිර්මිත චලන ලෙසයි

10. සක්‍රීය ප්‍රේක්ෂක සහභාගීත්වයක් නොපැවතිය නොහැකි කලාංගය වන්නේ,

| | |
|---|---|
| 1. වේදිකා නාට්‍ය | 2. ඔපෙරා |
| 3. ටෙලි නාට්‍ය | 4. මුද්‍රා නාට්‍ය |

11. පහත රට පළාතේ ? ප්‍රචලිත ශාන්ති කර්මයන්ට අයත් අනතර් රංග අවස්ථාවක් නොවන්නේ,

| | |
|---|---|
| 1. දෙලහ පෙලපාලිය | 2. රමා මැරීම |
| 3. කපුයක්කාරිය | 4. කඩවත්කරණය |

12. දර්පණ අභ්‍යාස රූපණ ශිල්පියෙකුට උපකාරී වන්නේ,
    1. සබකෝලය දුරුකර ගැනිම
    2. සාත්වික අභිනය ප්‍රබල කර ගැනීමට
    3. ක්ෂණිකව ක්‍රියාත්මක වීමේ හැකියාව වර්ධනය කරගැනිම
    4. ස්මරණ ශක්තිය වර්ධනය කර ගැනීමට

13. කටහඬ හා වචන උච්ඡාරණ පුහුණුව සඳහා වඩාත් යෝග්‍ය වන්නේ,
    1. ලෝවැඩ සඟරාව, ගුත්තිල කාව්‍ය
    2. සුභාෂිතය , ගණ දෙවි හැල්ල
    3. සකස්කඩ, බුද්ධ ගජ්ජය
    4. මහා වංශය, ථූප වංශය

14. දක්ෂිණ භාරතීය කර්ණාටක සංගීතයේ හා උත්තරභාරතීය හින්දුස්ථානී සංගීතයේ ආභාසය ලැබූ නාට්‍ය සම්ප්‍රදාය වන්නේ,

| | |
|---|---|
| 1. ටවල් හෝල් හා ටීටර් නාට්‍ය | 2. නූර්ති හා මිනර්වා නාට්‍ය |
| 3. ටීටර් හා මිනර්වා නාට්‍ය | 4. නාඩගම් හා නූර්ති නාට්‍ය |

15. නාට්‍යෝචිත අවස්ථාවක ලක්ෂණයක් වන්නේ,
    1. සංගීතය අනිවාර්යවීමයි
    2. චරිත අතර ගැටුමක් උද්ගතවීමයි
    3. සතුටින් අවසන්වීමයි
    4. චරිත අතර සංවාද භාවිතාවීමයි

PAST PAPERS WIKI

16. ''වේදිකාව මත නළුවෙකු ක්ෂණයෙන් පුළුන් රොදක් මෙන් සැහැල්ලුවෙන් ඇද වැටි පෙරලෙයි ''. මෙම නිරූපනය සාර්ථකව ඉදිරිපත් කිරිම සඳහා ප්‍රගුණ කළ යුතු රංග අභ්‍යාසය වන්නේ,
    1. ශිථිලකරණ අභ්‍යාසයයි
    2. තාපන අභ්‍යාසයයි
    3. සංවේදන අභ්‍යාසයයි
    4. කටහඬ අභ්‍යාසයයි

17. ක්‍රියාවක් අනුකරණය කිරීම නාට්‍යයයි ලෙස ප්‍රකාශ කරන ලද්දේ,
    1. භරතමුණි පඬිතුමා විසිනි
    2. ධනංජය පඬිතුමා විසිනි
    3. ඇරිස්ටොටල් පඬිතුමා විසිනි
    4. මහෞෂධ පඬිතුමා විසිනි

18. වැරදි සම්බන්ධයක් සහිත යුගල තෝරන්න
    1. හෙළ ගැඹුරුයි පුත නොබලන් - වැල් පාලම
    2. කඬේට පලයන් චූංචෑන් - තාරාවෝ ඉගිලෙති
    3. කන්ද උඩින් හඳ පාලන ලීලා - බක්මහ අකුණු
    4. පොත් හතක් අටක් දූනටත් ලියා දලා - මී පුරවැසියෝ

19. සමාරෝපය සම්බන්ධ නිවැරදි නොවන ප්‍රකාශය වන්නේ
    1. රංගභූමි පාලක සතු කාර්යයකි
    2. තමාගේ පෞද්ගලිකත්වය අතහැර අනෙකෙකුගේ ස්වරූපය ගැනීමයි
    3. බාහිර හා අභ්‍යන්තර වශයෙන් ප්‍රභේද දෙකකින් යුක්තය
    4. සාර්ථක රංගනයක් සඳහා නලුවාට අත්‍යාවශ්‍ය වේ.

✳ **පහත සඳහන් තොරතුරු ඇසුරින් 20 - 25 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න**

A සොත්තානා
B සූනියම් යක්ෂණිය
C පත්තිනි
D මැණික්පාලි
E උනුනපියන
F කලු කුමාර
G මහා සම්මත
H සේරමාන
I මංගර කුමරු

20. උඩරට ප්‍රදේශයට ආවේණික ශාන්ති කර්මය හා බැඳෙන අක්ෂරය වන්නේ,
    1. F 2. G 3. H 4. I

21. B අක්ෂරයෙන් දක්වෙන චරිතය හා සබදතාවක් දක්වනුයේ,
    1. සූනියම් යාගය
    2. සන්නි යකුම
    3. කෝළම්
    4. සොකරි

22. කිරිමඩු ශාන්ති කර්මය හා ගම්මඩු ශාන්තිකර්මය හා සබඳතාවයක් දක්වන අක්ෂරය වන්නේ,
    1. C හා G 2. G හා H 3. H හා I 4. G හා I

23. වඩිග පටුන නම් අන්තර් රංග අවස්ථාව සහිත ශාන්තිකර්මය හා සබඳතාවයක් දක්වන අක්ෂරය වන්නේ,

1. B　　2. C　　3. D　　4. E

24. වෙස් මුහුණු නාටක හා සම්බන්ධ චරිතයකි.

1. A　　2. C　　3. D　　4. G

25. උඩරට ප්‍රදේශයේ ප්‍රචලිත ගැමි නාටකයේ චරිතයක් හා පහතරට ශාන්තිකර්මයක රංගෝපකරණයක් අන්තර්ගත අක්ෂර වනුයේ,

1. A හා E　　2. A හා C　　3. H හා F　　4. G හා F

✴ **පහත වගුව ආශ්‍රයෙන් 26-32 තෙක් ප්‍රශ්න වල පිළිතුරු සපයන්න.**

| **නාට්‍යයේ නම** | **මුල් කෘතියේ රචක** | **අනුවර්තකයේ පරිවර්තකගේ නම** | **අනුවර්තක /පරිවර්තක** |
|---|---|---|---|
| කැට් ඔන් ද හොට් ටින් රූෆ් | A | හෙලේ නැග්ග ඩෝංපුතා | B |
| C | හෙන්රික් ඉබ්සන් | D | සුනන්ද මහේන්ද්‍ර |
| වෙයිටින් ෆෝ ගොඩෝ | E | ගොඩෝ එනකං | ජේ.ඒ.සෙල්වදෙරේ |
| F | එව්ගිනි ෂ්වාත්ස් | G | සිරිල් සී පෙරේරා |

26. A හි ඇතුළත් විය යුතු නම වන්නේ,

1. බර්ටෝල් බ්‍රෙෂ්ට්　　2. ටෙනසි විලියම්ස්
3. ගාර්ෂියා ලෝර්කා　　4. ලුයිජි පිරැන්ඩලෝ

27. B හි ඇතුළත් විය යුතු වන්නේ,

1. බන්ධුල ජයවර්ධන　　2. සුගතපාලද සිල්වා
3.. යූ.ඒ.ගුණසේකර　　4. රංජිත් ධරමකීර්ති

28. ඉහත වගුවේ C හි ඇතුළත් විය යුතු වන්නේ,

1. ද පබ්ලික් එනිමි　　2. ඩෝල්ස් හවුස්
3. ද ඩ්‍රැගන්　　4. ද එල්ඩර් සන්

29. D හි ඇතලත් විය යුත්තේ,

1. සකල ජන　　2. සමාජයේ කුළුණු
3. ජන හතුරා　　4. නම්බුකාර අභිසරුලිය

30. E හි ඇතුළත් විය යුතු වන්නේ,

1. ඇල්බෙයා කැමූ　　2. සමුවෙල් බෙකට්
3.. ටෙනසි විලියම්ස්　　4. ඉයුජින් අයනෙස් කෝ

Past Papers Wiki

31. ඉහත වගුවේ F හි ඇතුළත් විය යුතු වන්නේ

1. ද ඩ්‍රැගන්
2. ඉක්නෙව්ටාඉ
3. රූඩන්ස්
4. චෙරි ඕර්චර්ඩ්

32. G හි ඇතුළත් විය යුතු වන්නේ

1. මරාසාද්
2. හරිම බඩු හයක්
3. මකරා රාක්ෂ
4. මකරා

✳ **පහත දැක්වෙන ඡායාරූප ඇසුරින් ප්‍රශ්න අංක 33 සිට 37 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**







A B C D E

33. ලෙඩක් නැති ලෙඩෙක් නාට්‍ය නිෂ්පාදනය කරමින් නාට්‍ය ක්ෂේත්‍රයට අවතීර්ණ වූ නාට්‍ය කරුවා වන්නේ,

1. A
2. B
3. C
4. D

34. මෝදර මෝල නාට්‍යයේ චරිතයක් රඟ දක්වමින් ජනාදරයට පත් රංගන ශිල්පියෙකි.

1. E
2. D
3. A
4. B

35. ඉංග්‍රීසි නාට්‍ය නිර්මාණවලට දයක වූ කලාකරුවන් දෙපලකි.

1. AB
2. CD
3. DE
4. BD

36. තාරාවෝ ඉගිලෙති නාට්‍යයට රංගනයෙන් දයක වූ ක්ෂේත්‍ර ගණනාවකටම අතිදක්ෂ රංගන ශිල්පියෙකු වන්නේ,

1. E
2. C
3. D
4. E

37. ලෝකධර්මී නාට්‍ය වලට සංගීතය අත්‍යාවශ්‍ය සාධකයක් නොවන බව පසක් කර දුන් නාට්‍යකරුවාට අදළ අක්ෂරය වන්නේ,

1. C
2. E
3. B
4. D

38. බෝඩිංකාරයෝ නාට්‍ය රචනය සහ අධ්‍යක්ෂණය කළේ,

1. පරාක්‍රම නිරිඇල්ල
2. සුගතපාලද සිල්වා
3. සයිමන් නවගත්තේගම
4. බන්දුල ජයවර්ධන

Past Papers Wiki

39. පැරණිතම නාඩගම් රචකයා ලෙස හඳුන්වන්නේ,

1. පිලිප්පු සිඤ්ඤෝ ය
2. ජෝන් ද සිල්වා
3. සී. දොන් බස්තියන්
4. ක්‍රිස්තියන් පෙරේරා

40. චිත්‍ර වස්ත්‍ර භාවිතා කරන ලද්දේ,

1. සොකරි නාට්‍යයේය
2. කෝලම් නාටකයේය
3. නාඩගම් වලය
4. ශාන්තිකර්ම වලය

## II කොටස

✶ **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

01. 1. දික්තල කාලගෝල නාට්‍යයේ පිටපත රචනා කරන ලද්දේ කවුරුන් විසින්ද?
2. මෙම නාට්‍යයේ පොතේ ගුරු නාට්‍ය ආරම්භයේදී ඉදිරිපත් කරනු ලබන නාට්‍ය අංගය කුමක්ද ?
3. එම නාට්‍යයේ පූර්ව රංගනය යටතේ ඉදිරිපත් කෙරෙන අංගය කුමක්ද?
4. මහෞෂධ පඬිතුමා කාලගෝල ප්‍රශ්නය විසඳීමට අනුගමනය කළ උපක්‍රමය කුමක්ද?
5. නාට්‍යයේ සංවාද වලින් පැවසෙන ආකාරයට දික්තලා කනස්සල්ලෙන් පසුවන්නේ ඇයි දැයි සඳහන් කරන්න.
6. දික්පිටියා ගේ චරිතයෙන් ප්‍රකට වන ගති ලක්ෂණ **දෙකක්** ලියන්න.

(ලකුණු 02 x 06 = 12)

02. 1. පහත රට ප්‍රදේශවල ප්‍රචලිතව තිබූ ගැමි නාටකයේ දක්නට ලැබෙන චරිත **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02)
2. එම ගැමි නාටකයේ විශේෂ ලක්ෂණ **04ක්** ලියන්න. (ලකුණු 04)
3. ඉහත සඳහන් ගැමි නාටකයේ රංග ශෛලිය කරුණු **03 ක්** ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

03. 1. අංග රචනය යනු කුමක්දැයි හඳුන්වන්න. (ලකුණු 02)
2. නාට්‍යයක අංග රචනය කිරීම සඳහා භාවිතා කරන ද්‍රව්‍ය සහ උපකරණ හතරක් ලියන්න (ලකුණු 04)
3. අංග රචනා ශිල්පියෙකු නාට්‍යයක චරිතයක් අංග රචනා කිරිමේදී සැලකිලිමත් විය යුතු කරුණු 03 ක් විස්තර කරන්න. (ලකුණු 06)

04. 1. නාට්‍යයක සාර්ථකත්වයට හෝ අසාර්ථකත්වයට සෘජුවම වගකියන සොඳුරු ආශ්‍රදයකයා ලෙස හඳුන්වන්නේ කවරෙක්ද? (ලකුණු 02)
2. නාට්‍යයක් සාර්ථක කරගැනීම සඳහා දයක වන ශිල්පීන් **04ක්** නම් කරන්න. (ලකුණු 04)
3. නාට්‍යයක නිෂ්පාදන කාර්යය විස්තර කරන්න. (ලකුණු 06)

05.



1. ඉහත ඡායාරූපයේ දැක්වෙන නාට්‍යකරුවාගේ නම සඳහන් කරන්න (ලකුණු 02)
2. එම නාට්‍යකරුවාගේ නාට්‍ය **හතරක්** ලියන්න (ලකුණු 04)
3. එම නාට්‍යකරුවාගෙන් ශ්‍රී ලාංකීය නාට්‍ය කලාවට සිදුවූ සේවාව අගයන්න. (ලකුණු 06)

06. 1. ඔබ දන්නා පහතරට ශාන්තිකර්ම **දෙකක්** ලියන්න (ලකුණු 02)
2. කාන්තාවන් උදෙසාම පමණක් පවත්වනු ලබන පහතරට ශාන්තිකර්මයේ නාට්‍යමය පෙළපාළි **දෙකක්** ලියන්න. (ලකුණු 04)
3. ඉහත 1 හි ඔබ සඳහන් කළ එක් ශාන්තිකර්මයක් තෝරාගෙන නාට්‍යමය ලක්ෂණ **තුනක්** ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

07. දසුන් 11 ශ්‍රේණියේ ඉගෙන ගන්නා දරුවෙකි. ඔහුගේ විනෝදාංශය වන්නේ නව නිර්මාණ සැකසීමයි. දසුන් ඔහුගේම නිවසේ කාමරයක සැකසූ විද්‍යාගරයක AI තාක්‍ෂණය යොදගෙන රොබෝ කෙනෙකු නිෂ්පාදනය කරමින් සිටින අතර තුර .......
1. පසුබිම, කාලය හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමග සංවාද රචනා කිරීම සඳහා (ලකුණු 02)
2. චරිත අතර ගැටුමක් ඇතිවන අසුරින් අවස්ථා ගොඩනැගීම සඳහා (ලකුණු 04)
3. කුතුහලය දනවන නොසිතූ පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම (ලකුණු 06)

☆☆☆

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library